**ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-6) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගැනීම් ලෙස රු.114,328,048 ක් දක්වා තිබුණ ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මූලධන වියදම ලෙස රු.131,050,045 ක් දැක්වීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ සෘණ මුදල් ප්‍රවාහය රු.16,721,997 කින් වැඩියෙන් දක්වා තිබුණි. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා වූ රු.12,847,899 ක් හා හැකියා වර්ධනය සඳහා වූ රු.3,874,098 කින් සමන්විත විය. | භාණ්ඩාගාරයෙන් ලද උපදෙස් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූලධන වියදම යටතට මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා රු.12,847,899 ක් ද, මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු. 114,328,048 ක් ද, හැකියා වර්ධන සඳහා වූ රු. 3,874,098 ක් ද, අන්තර්ගතකර ඇති අතර, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (**ACA-6**) තුළ අන්තර්ගත වනුයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් සඳහා වූ රු.114,328,047 ක් පමණක් බව දන්වා ඇත. | නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට වග බලාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.182,827,098 ක් වැයකර තිබුණ ද, රු.114,328,047 ක් පමණක් මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම හේතුවෙන් රු.68,499,051 ක් වූ වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. එම වත්කම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මිලදී ගෙන තිබුණු ඒවා බව නිරීක්ෂණය විය. | එම රු.182,827,098 ක් තුළ මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම රු. 68,489,051 ක් අන්තර්ගත වන අතර, එම වියදම මූල්‍ය නොවන වත්කම් ලෙස CIGAS පද්ධතියේ හඳුනාගත නොහැකි බැවින් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් ලෙස හඳුනාගෙන නොමැත.<br>තව ද, මෙම ප්‍රතිපාදනය මත සිදුකරන ලද වත්කම් මිලදී ගැනීම් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යවල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතුකර ඇති බව දක්වා ඇත. | වත්කම් සංචලනයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 7 ක සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.3,160,269 ක හිඟ සමථ මුදල්වලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අය කර නොතිබුණු අතර, අයකිරීම් පිළිබඳ තොරතුරු පවත්වාගෙන නොයන රු.12,191,593 හිඟ සහ දඩ ආදායම් ශේෂ සම්බන්ධයෙන් 2019 ජූලි 23 දිනැති අංක 11/2019 දරන රෙජිස්ට්‍රාර් ජනරාල් චක්‍රලේඛය පරිදි කටයුතුකර නොතිබුණි. | ආරම්භක ශේෂය තුළ වර්ෂ ගණනාවක් මුළුල්ලේ පවතින හිඟ/ දඩ ශේෂයන් ද ඇතුළත් වී ඇති අතර, 2019.07.23 දින සිට හිඟ/දඩ දෙපාර්තමේන්තුව මගින් අය නොකරන අතර, වාර්තාවල පවත්වාගෙන ආ ශේෂයන් පොත්වලින් ඉවත් කිරීමට නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය. |
| (ආ) | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 44 ක සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.20,806,353 ක් සහ වර්ෂය තුළ පැනවීම් රු.7,111,533 ක අයවිය යුතු සමථ මුදල්වලින් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුණේ රු.7,451,243 ක් හෙවත් සියයට 27 ක් පමණි. | වර්ෂයේ ආරම්භක ශේෂය රු.20,806,353 සහ වර්ෂය තුළ පැනවීම් රු.7,111,533 ක් වුව ද, වර්ෂය තුළ අය කරගැනීම් රු.7,451,243 ක් බව දක්වා ඇත. | හිඟ ආදායම් අයකරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලික ආදායම් ඇස්තමේන්තු අනුව රුපියල් මිලියන 8 කට ඇස්තමේන්තු කළ නොතාරිස්වරුන්ට මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු, රුපියල් මිලියන 11 දක්වා සියයට 38 කින් හෙවත් රු. මිලියන 3 කින් වැඩිකර තිබුණ ද, වර්ෂය තුළ රැස්කළ ආදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 19 කින් හෙවත් රු.2,060,808 කින් අඩුවී තිබුණි. | මූලික ඇස්තමේන්තුව රු.මි.8 කට සකස්කළ ද, 2023.05.31 දින වන විට සත්‍ය ආදායම සලකා බලා රු.මි.11 කට සංශෝධිත ඇස්තමේන්තුව වැඩි කළ ද, 2023 වර්ෂයේදී නව නොතාරිස්වරු බඳවාගැනීම අඩු වීම හේතුවෙන් රැස්කළ ආදායම, සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 19 කින් අඩුවීමට හේතු වී ඇති බව දන්වා ඇත. | නිසි අධ්‍යයනයකින් යුතුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට වගබලාගත යුතු ය. |
| (ඈ) | මු.රෙ.143(2)(ඊ) හා මු.රෙ.175(2) ප්‍රකාරව හිඟ ආදායම් එකතුකර ගැනීමටත්, අයකරගත නොහැකි ආදායම් අතහැර දැමීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් වසර ගණනාවක සිට පැවත එන හිඟ ආදායම් ඒකරාශී වී පවතින අතර මුදල් එකතු කිරීමෙහිලා යම් නිලධාරියෙකුගේ නොසැලකිල්ල හෝ අකාර්යක්ෂමතාවය හේතුවී තිබේ නම් ඒ සම්බන්ධයෙන් මු.රෙ.176(3) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | වර්ෂ ගණනාවක් මුළුල්ලේ අය කරගැනීමට නොහැකි වූ හිඟ මුදල් අත්හැර දැමීමට නියෝගයක්, ගණන්දීමේ නිලධාරියාගෙන් ලබාගැනීමට කටයුතු කරමින් පවතින අතර, මේ පිළිබඳ හැකි විගස ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ගිණුම්ගතකර ඇති හිඟ ආදායම් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි 6(ඈ) ඡේදය ප්‍රකාරව, කාර්ය මණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්යය පුහුණුවීම් සඳහා පමණක් අවස්ථා ලබාදිය යුතු වුව ද, එම ගණයට නොගැනෙන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාමූහිකව නිලධාරීන් සඳහා සිදු කරන බාහිර යොමුගත පුහුණුවීම් සඳහා ද රු.2,595,372 ක් වැයකර තිබුණි. | දෙපාර්තමේන්තු ගත චක්‍රලේඛ, අණපනත් පිළිබඳවත් ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ කරුණු ආවරණය වන පරිදි ඒ ඒ නිලධාරීන් විසින් සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු අනිවාර්යය පුහුණුවීම් සඳහා පුහුණු අවස්ථා ලබාදෙන අතර, නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා කාලීන හා අත්‍යාවශ්‍ය කරුණක් ලෙස වටහාගත් බැවින්, සමස්ථ නිලධාරීන් ඒ සඳහා පුහුණු කළ බව දක්වා ඇත. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෘදුකාංග සංවර්ධනය සඳහා වූ රු.199,000,000 ක, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම සඳහා රු.3,500,000 ක් සහ ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම සඳහා රු.3,500,000 ක් ලෙස වසරේ මූලික වියදම් ඇස්තමේන්තුව පිළිවෙලින් රු.114,000,000, රු.78,500,000 සහ රු.13,500,000 දක්වා සංශෝධනයකර තිබූ අතර, එය මූලික ඇස්තමේන්තුවට වඩා පිළිවෙලින් සියයට 51 ක අඩුවීමක් ද, සියයට 1956 ක සහ සියයට 285 ක අසාමාන්‍ය වැඩිවීමක් ද විය.<br>මෘදුකාංග සංවර්ධනය සඳහා වූ වියදමේ අඩුවීම අයවැය චක්‍රලේඛ අනුව වියදම් සීමා කිරීමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණ ද, එය පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. | දෙපාර්තමේන්තුවේ දත්ත ආවරණ පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවලංගු වීම හේතුවෙන් රු.මි. 85 ක මුදලක් මු.රෙ. 66 මාරුකිරීම් යටතේ රු.මි. 75 ක් 254-1-2-2103 වැය විෂයයට ද, රු.මි. 10 ක් 254-1-2-2102 වැය විෂයයට ද, මාරු කරන ලදී. | ප්‍රමුඛතාවය මත වසරේ ඉටුකිරීමට සැලසුම් කළ කටයුතු සැලසුම් කළ ආකාරයට සිදු කළ යුතු ය. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැරකම් ලේඛනය අනුව වැය විෂයයන් 14 ක බැරකම් රු.133,990,340 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනය අනුව එය රු.74,669,984 ක් වූයෙන් රු.59,320,356 ක වෙනසක් නිරීක්ෂණය විය. | බදු කුලී, ජල විදුලිය, ආරක්ෂණ හා සනීපාරක්ෂක සේවා වැනි අත්‍යාවශ්‍ය වියදම් ද, ආදායම් උත්පාදනය සඳහා සෘජුව දායක වන ඡායා පිටපත් සේවාව සඳහා ද, ප්‍රමාණවත් ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් ලබා නොදීම හේතුවෙන් සීමාවන් ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුව ඇති බව දන්වා ඇත. | ප්‍රතිපාදිත සීමාව තුළ වියදම් කළමනාකරණය කරගැනීමට වග බලාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලියේ සියලු පියවරයන් සිගාස් ගිණුම්කරණ පද්ධතියට ඇතුළත්කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව CIGAS පරිගණක පද්ධතියට දෛනිකව ලැබෙන වවුචර්පත් පළමුව බැඳීම් ලෙස ඇතුළත්කර පසුව ගෙවීම් කරනු ලබන අතර, එසේ ඇතුළත් නොකර ගෙවීම් කිරීමට නොහැකි බව දක්වා ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කළ යුතු ය. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බිම් සවිය මිලදී ගැනීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.මිලියන 25 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 23.28 ක් පමණක් වැයකර තිබුණු අතර, ආයෝජන හිතකර පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.මිලියන 12 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන වෙනුවෙන් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 7.21 ක් පමණක් විය. | හිමිකම් සහතික මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය **GSM** ප්‍රමාණයේ කඩදාසි සපයා ගැනීමේ අපහසුව මත මුද්‍රණයකර තිබුණේ 45,000 ක ප්‍රමාණයක් පමණි. එම මුද්‍රණ කටයුතු අවසන් වන විට 2023.12.19 දින වූ අතර, එම ප්‍රමාණය සඳහා සත්‍ය වියදම වූයේ රු.569,250 ක් පමණි. රු.මි.1.4 ක ප්‍රතිපාදන ඉඩම් අමාත්‍යාංශය වෙත පවරාදී ඇති අතර, සහතික මුද්‍රණය සඳහා වැය වූ රු.569,250 ගෙවන ලෙස දන්වා ඇත. ඒ අනුව රු.321,541 ක ප්‍රතිපාදන වැයනොකර ආපසු යැවීමට සිදුවූ බව ද, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ලබාදී තිබූ මිලියන 12 ක ප්‍රතිපාදන වලින් එම කටයුතු සිදුකළ නිලධාරීන් සඳහා අතිකාල අනුමැතිය නොලැබීම මත එම මුදල් උපයෝජනය කිරීමට නොහැකි වූ බවද දක්වා ඇත. | ප්‍රතිපාදිත මුදල් ප්‍රතිපාදිත කාරණය සඳහාම වැය කිරීමට වගබලා ගත යුතු ය. |

## 2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායීව පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා මු.රෙ. බලතල පැවරීම සිදුකර ඇති අතර, එහි පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| **(i)** | 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් සංශෝධිත පනත සහ 1994 පෙබරවාරි 18 දිනැති අංක 04/1994 දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | | 2015 සිට 2022 වර්ෂය දක්වා වත්කම් හා බැරකම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශ නිලධාරීන් දෙදෙනෙකු ලබාදී නොතිබූ අතර, නිලධාරීන් 21 දෙනෙකු වාර්තා අඩුවෙන් ලබාදී තිබුණි | වසර ගණනාවක වත්කම් බැරකම් ප්‍රකාශ ලබානොදුන් නිලධාරීන් වෙත ලිඛිතව ද දැනුම්දීම්කර ඇත. 2024 වර්ෂය සඳහා 2024.03.01 දිනැති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන | පනතේ හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොමිෂන් සභා චක්‍රලේඛය 01/2024 අනුව කටයුතු කරන ලෙසට නිලධාරීන් දැනුවත්කළ බව දන්වා ඇත. | |
| **(ii)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | VI වැනි පරිච්ඡේදයේ 2.10 වගන්තිය | රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියට බඳවාගන්නා ලද නිලධාරින් සම්බන්ධයෙන් ගන්නා ලද පියවරයන් විගණකාධිපති වෙත වාර්තාකර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, මින් ඉදිරියට නිවැරදි කරමින් කටයුතු කිරීමට සටහන්කර ගත් බව දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| | XII වැනි පරිච්ඡේදයේ 38.18 වගන්තිය | රජයේ නිලධරයන් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ වාර්තාවක් මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, මින් ඉදිරියට නිවැරදි කරමින් කටයුතු කරන බව දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කාර්යක්ෂමව කටයුතු කළ යුතු ය. |
| | XV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය | මාණ්ඩලික/විධායක මට්ටමේ රාජ්‍ය නිලධරයන් විදේශ සංචාරයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වීමට පෙර අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික/විධායක මට්ටමේ නිලධාරීන් **05** දෙනෙකු එම පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව, දිවයිනෙන් බැහැර වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන විවිධ පුහුණු වැඩසටහන් සඳහා එක් එක් කාලසීමාවන් තුළදී සහභාගි වූ බවත්, ඒ සඳහා අමාත්‍යවරයාගෙන් නිවාඩු අනුමතකර ගත් බවත් දන්වා ඇත. | මාණ්ඩලික/විධායක මට්ටමේ රාජ්‍ය නිලධරයන් අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | XXIV වැනි පරිච්ඡේදයේ 4 වන වගන්තිය | වර්ෂ **07** සිට වර්ෂ **28** ක කාලපරාසයක් තුළ නිලධාරීන් **20** දෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු.886,949 ක ණයශේෂ පොත්වලින් ඉවත් කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. | වර්ෂ **07** සිට **28** ක කාලපරාසයක් තුළ වැඩ තහනම් කළ**,** සේවය හැරගිය සහ සේවයෙන් ඉවත් කළ අනෙකුත් නිලධාරීන්ගෙන් තවදුරටත් අයකරගත හැකි ණයශේෂ පිළිබඳ තොරතුරු සෙවීමටත්**,** නොඑසේ නම්**,** ණය ශේෂය කපාහැරීමට අමාත්‍යාංශ අනුමැතිය ලබාගැනීම සහ නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීම යන පියවරයන්ට යොමුවන බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| **(iii)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | අංක 756 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11.1 ඡේදය. | 2022 වර්ෂය දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කිරීමක් සිදුකර නොතිබුණු අතර, පසුගිය වර්ෂයන්ට අදාළව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ගබඩා තොග සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2022 වර්ෂය දක්වා සිදුකර නොමැති බව පිළිගන්නා අතර, දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර සාමාජිකයින් දෙදෙනෙකු ද ඇතුලුව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් විශේෂ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති අතර, අනතුරුව 2023 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ද මේ වන විට අවසන්කර ඇති බව දන්වා ඇත. | යොමුගත චක්‍රලේඛයට හා රෙගුලාසියට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| **(iv)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක 158 | සෑම වර්ෂයක ම ජනවාරි 01 හා ජූලි 01 වන දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනය යාවත්කාලීන කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | 2024.07.01 දින සිට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඇතුළත් කිරීමට කටයුතුකර ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතු ය. |
| **(v)** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛය | | | |
| | 11.1ඡේදය | ඉකුත් වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගත් පොදු 47 වාර්තාවේ සඳහන් අයිතම 07 කට අදාළ භාණ්ඩ 48 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතුකර නොතිබුණි. | තොරතුරු තාක්ෂණ අංශයේ නිර්දේශ ලබා ගැනීම සඳහා දැනුම ඇති කාර්යය මණ්ඩලවල ඌනතාවය හේතුවෙන් නිර්දේශ නොලැබීම මත සුදුසු පරිදි කටයුතු කිරීම ප්‍රමාද වී ඇති අතර, තොරතුරු අධ්‍යයනයකර නොපමාව කටයුතු කරන බව දක්වා ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතු ය. |
| | 13.2ඡේදය | 2021 වර්ෂය වන විට ද අපහරණය සඳහා හඳුනාගෙන තිබූ වාහන 05 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | වාහන 3 ක වැසි අංක මැකී ඇති බැවින්, එම වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ඉල්ලා 2024.01.12 දින ලිපියක් යොමුකර ඇති අතර, තවම පිළිතුරු ලැබී නොමැති බව දක්වා ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| **(vi)** 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය 3.1 ඡේදය | නව සිගාස් වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත යුතු SA-12, SA- 21, SA-50, SA-90 හා ඇමුණුම iii - බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන හා ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර නොතිබුණි. | SA-12, SA-21, SA-50 සහ SA-90 ඇමුණුම් ඉදිරිපත් කිරීම අතපසු වී ඇති බව ද, CIGAS වෙබ් යෙදුමට බැරකම් උඩුගත කිරීමේ හැකියාවක් ද නොපැවතීම නිසා ඇමුණුම iii-බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව ද දක්වා ඇත. | ගිණුම් මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| **(vii)** 2022 ඔක්තෝබර් 21 දිනැති අංක 15/2022 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ චක්‍රලේඛය | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 13 කින් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්තා 103 ක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යොමුකර නොතිබුණි. | බොහෝ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් සමථ මුදල් වාර්තාව නිසි පරිදි ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර ඇති අතර, වාර්තා එවා නොමැති කාර්යාල වෙත සිහි කැඳවීම් යවා කඩිනමින් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතුකර ඇති බව දන්වා ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතු ය. |

**2.7 අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) **අධිකාර බලය නොමැති ගෙවීම්**

දෙපාර්තමේන්තුව විසින් අධිකාර බලය නොමැතිව පහත සඳහන් ගෙවීමකර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඊ - ඉඩම් ව්‍යාපෘතිය යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 04 ක පත්ඉරු 3,751,113 ක් මාස 03 ක් ඇතුළත පරිලෝකනය කිරීම සහ දත්ත ඇතුළත් කිරීම සඳහා වූ රු.83,687,331 ක ඇස්තමේන්තු ගත ව්‍යාපෘතියට අදාළ ප්‍රතිග්‍රහණ ලිපිය 2023 අගෝස්තු 29 | පත්ඉරු පරිලෝකනය කිරීමේ ප්‍රසම්පාදන කාර්යය 2023 ජූලි මස පුවත්පත් දැන්වීමක් පළ කිරීම මඟින් 2023.08.21 දින ප්‍රසම්පාදන කමිටුව ලබාගත් තීරණය ලේකම්තුමා විසින් අනුමතකර ඇත. ඒ අනුව ප්‍රසම්පාදන කාර්යය පිරිනැමීමේ ලිපිය | මුදල් රෙගුලාසිවලට අනුකූලව සියළු ගෙවීම් විධිමත්ව සිදු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | දින නිකුත් කර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පරිලෝකනය කළ පත්‍රිකා 3,614,823 ක් වෙනුවෙන් රු.80,646,700 ක් ගෙවා තිබුණ ද, එම ගෙවීම සඳහා දෙපාර්ශවය අතර, එළඹි විධිමත් ගිවිසුමකින් මු. රෙ. 136 හා 137 ප්‍රකාර වූ අධිකාර බලයක් සහ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. කෙසේ වුව ද, 2024 මාර්තු 20 දින දෙපාර්ශවය ගිවිසුමකට එළඹීමට කටයුතුකර තිබුණි. | 2023.09.02 දින එම ආයතනය භාරගන්නා බවට ප්‍රතිග්‍රහණ ලිපියක් භාරදී ඇත. එමගින් විධිමත් ගිවිසුමක් අත්සන් නොවුව ද, එමගින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා අදාළ ආයතනය අතර ගිවිසුමක් ඇති වී ඇත. කෙසේ වුව ද, 2024.03.20 දිනැතිව අදාළ ආයතනය හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ගිවිසුම අත්සන්කර ඇති බව දක්වා ඇත. | |

## 2.8 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 න් සංශෝධිත මු.රෙ.371 (5) ප්‍රකාරව අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් වෙත ලබාදී තිබූ රු.724,535 ක අතුරු අග්‍රිම 16 ක් පියවීමට, අදාළ නිලධාරීන් දින 18 සිට මාස 05 ක් දක්වා වූ කාල පරාසයක් ප්‍රමාදකර තිබුණි. | මින් ඉදිරියට විවිධ කාර්යයන් සඳහා ලබාදෙනු ලබන අත්තිකාරම් අදාළ කාර්යය අවසන්කර දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට පියවර ගනු ලබන බව දන්වා ඇත. | අත්තිකාරම් නියමිත කාලය තුළ පියවා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | නිලධාරින් දෙදෙනෙකු වෙත ලබාදුන් මුල් අත්තිකාරම් පියවීමට පෙර අවස්ථා 19 කදී රු.864,100 ක අත්තිකාරම් මුදල් නැවත ලබා දී තිබුණි. එසේම සෑම අවස්ථාවකම මෙම නිලධාරීන් දෙදෙනා අතරැදී අත්තිකාරම් ප්‍රමාණය රු.100,000 ඉක්මවා තිබුණ ද, මේ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් පූර්ව අවසරය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. | එකම නිලධාරියාගේ නමින් අත්තිකාරම් ලබාදී තිබුණ ද, එම අත්තිකාරම් ලබාදී ඇත්තේ විවිධ අංශවල කාර්යයන් වෙනුවෙන් බව ද, මින් ඉදිරියට අත්තිකාරම් ඉල්ලුම් කරන නිලධාරියා විසින් ඊට පෙර ලබාගෙන ඇති අත්තිකාරම් නිරවුල්කර ඇත්නම් පමණක් නව අත්තිතාරම් නිකුත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කිරීමේ අපේක්ෂාවෙන් වර්ෂයට අදාළ දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ රු. මිලියන 108 ක ඇස්තමේන්තුගත වගකීම් ක්ෂේත්‍ර 08 කට අයත් ක්‍රියාකාරකම්වලින් වැඩසටහන් 14 ක් වර්ෂය තුළ ක්‍රියාත්මකකර හෝ නිමකර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඊ - ටයිට්ල් වැඩසටහන (e – Title)<br>ඊ - ඉඩම් (e - Land) ව්‍යාපෘතියට අදාළ පත්ඉරු පරිලෝකනය කටයුතු පෞද්ගලික ආයතන දෙකක් විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර 2018 වර්ෂය දක්වා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 20 ක, පත්ඉරු 11,595,197 ක් පරිලෝකනය කර තිබුණු අතර නියමු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 07 න් වැඩසටහන ක්‍රියාත්මක නොකළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 ක සහ කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2023 නොවැම්බර් 29 දින වන විට පත්ඉරු 3,624,151 ක් පරිලෝකනය කර නිම කිරීමට පෞද්ගලික ආයතනයක් වෙත නැවත භාරදී තිබුණ ද, නියමිත දිනය වන විට පරිලෝකනය කර නිමකර තිබූ පත්ඉරු ප්‍රමාණය 2,020,903 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට පත්ඉරු 9,328 ක් පරිලෝකනය කර නොතිබුණි. | 2022 වර්ෂය වන විට ඊ-ඉඩම් මෘදුකාංගයෙහි I වන හා II වන අදියර බොහෝ දුරට අවසන්කර 2023.01.01 වන දින කොළඹ හා හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ස්ථාපනය කර අත්හදා බලමින් අවශ්‍ය නවීකරණයන් සිදු කරන අතර, නියමු කාර්යාල 7 න් කොළඹ කාර්යාලය හා අනිකුත් කාර්යාල 3 ක පත්ඉරු පරිලෝකනය කරන ලදී. 2023 අගෝස්තු මාසයේදී නවීකරණය කරන ලද ඊ-ඉඩම් මෘදුකාංගයෙහි I වන අදියර කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ස්ථාපනයකර 2023.12.15 දක්වා එහි සියලුම කොට්ඨාශ සඳහා පරිලෝකනයකර අවසන්කර ඇති බව දන්වා ඇත. | වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ළඟාකරගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | කෙසේ වුවද, 2013 වර්ෂයේ සිට මේ වන තෙක් පරිලෝකනය කරන ලද පත්ඉරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ඇතුළත් ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සකස් කර නොතිබුණු අතර, එම පත්ඉරුවලට අදාළ ඔප්පු දෙවන පිටපත් පරිලෝකනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ද සිදුකර නොතිබුණි. | | |
| (ආ) | ඊ - ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන (e – Land Registry Program) | | |
| | ඉඩම් ලේඛන පරීක්ෂා කිරීමේ කටයුතු මාර්ගගතව සිදු කිරීමට පහසුකම් සැලසීමට හා ලේඛන ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ඊ-ඉඩම් (e - Land) පරිඝණක වැඩසටහන ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු 2016 වර්ෂයේ සිට සිදුකළ ද මෘදුකාංගයේ පැවති ගැටලු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එයින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට හැකිවී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළමු අදියර යටතේ ඉකුත් වර්ෂයකදී ලබාදී තිබූ රු.මිලියන 98.7 ක යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් උපාංගවලින් මෘදුකාංගයෙහි කටයුතු ස්ථාපිතකර ව්‍යාපෘතියට අදාළ කටයුතු ක්‍රියාත්මකකර තිබුණේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 6 ක පමණි. | මෘදුකාංගයෙහි ප්‍රතිනිර්මාණ කටයුතු 2018 වර්ෂයෙන් පසු ආරම්භ කරන ලද අතර, මෘදුකාංගයෙහි I හා II වන අදියර බොහෝ දුරට අවසන්කර ඇතත්, වරින් වර සිදුකරන ලද ගාස්තු වැඩිවීම් හා 2022.11.04 වන දින සිදුකර ඇති පනත් සංශෝධනයන්ට අනුකූලව මෘදුකාංගය සකස්කර ප්‍රතිනිර්මාණ කටයුතු ඉටුකර ගැනීමට සිදුවන බැවින්, අවශ්‍යතා ලේඛනගතකර තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය වෙත 2022/2023 වර්ෂයන්හිදී ලබාදී ඇතත්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ඉහත ආයතනය විසින් මෘදුකාංගය නිර්මාණය කරනු ලබන ආයතනය වෙත ලබානොදීමේ හේතුව මත 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පමණ තාක්ෂණික අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් මෘදුකාංගයෙහි ඉදිරි කටයුතු සිදුකරන අතර, 2024 අප්‍රේල් මාසය වන විට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 08 ක මෘදුකාංගයෙහි I වන අදියර ස්ථාපිතකර අවසන්කර ඇති බව දන්වා ඇත. | වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ළඟාකරගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) ඊ - ජනගහන ලේඛන වැඩසටහන (e- Population Registry Program)<br>රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරිම සම්බන්ධ තොරතුරු ඇතුළත් යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා 2010/2011 වර්ෂ වන විට නිර්මාණය කළ මෘදුකාංග පද්ධතිය 2019 වසරේ සිට ක්‍රියාත්මක නොවූ අතර, පසුව 2021 ජනවාරි 01 දින සිට නියමු ව්‍යාපෘතියක් ලෙස, තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ක්‍රියාත්මක කර තිබූ අතර, දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් 2021 ජනවාරි 01 දින සිට සිදු වූ සියලුම උපත් සහ මරණවලට අදාළ දත්ත ඇතුළත් කිරීම ආරම්භ කළ ද, එහි සේවා සහ නඩත්තු කටයුතුවල පවතින ගැටලු සහ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිකම මත එක් දිස්ත්‍රික්කයක පමණක් සහතික නිකුත් කිරීම ආරම්භකර තිබුණි. දිස්ත්‍රික්ක 25 ට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021, 2022 හා 2023 වසරවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි කළ උපත් 809,569 කින් 363,013 ක් හා ලියාපදිංචි කළ මරණ 530,920 කින් 217,430 ක් පමණක් දත්ත පද්ධතියට ඇතුළත්කර තිබූ අතර, විවාහ පිළිබඳ තොරතුරු කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව මෙම වැඩසටහනේ ද, අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වී නොතිබුණි. | ඊ-ජනගහන ලේඛන වැඩසටහන යටතේ ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ දිස්ත්‍රික් නියමු ව්‍යාපෘතිය 2023.12.05 වන දින සිට කළුතර දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර මේ වන විට ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබයි.<br>මෙහි ඊළඟ පියවර ලෙස දෙහිවල, ගම්පහ, කුරුණෑගල, රත්නපුර, තමන්කඩුව හා හඟුරන්කෙත යන නියමු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 හි ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිත ය.<br>LGN ගැටලු හා අනෙකුත් යටිතල පහසුකම් ප්‍රමාණවත් නොතිබුණ ද, අනෙකුත් කාර්යාලයන්හි ද මේ වන විට දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. එම දිස්ත්‍රික්කයන්හි ද ජාතික උප්පැන්න සහතිකය නිකුත් කිරීම ආරම්භ කිරීමට ප්‍රථම එම පහසුකම් හා දෙපාර්තමේන්තුවෙහි DR site සහ Backup පද්ධතිය ද ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් පවතී.<br>උපත් හා මරණ ලියාපදිංචියට අදාළව පමණක් මේ වන විට දත්ත පද්ධතිය සකස්කර ඇති අතර, මරණ ලියාපදිංචිය හා විවාහ ලියාපදිංචිය සම්බන්ධයෙන් ද වැඩිදියුණු කිරීම් කිහිපයක් සේවා හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන ආයතනය විසින් සිදු කරමින් පවතින බව දන්වා ඇත. | වසර ගණනාවක සිට ක්‍රියාත්මක වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රතිඵල කඩිනමින් ළඟාකරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයයේ 4.2.1. ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී මාර්ගෝපදේශවලට අනුකූලව අවම වශයෙන් ඉදිරි වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු පමණක් ඇතුළත් කර තිබුණි. එසේම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුළදී යාවත්කාලින කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම සඳහා ලබාදී ඇති ආකෘතියෙන් වසර තුනක තොරතුරු සඳහන් කිරිමට ඉඩක් වෙන්කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේ වුව ද, වසර තුනක තොරතුරු සටහන් කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරිමටත්, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීනකර ඇති නමුත්, මාස 06 කට වැඩි නොවන කාලයක් තුළදී යාවත්කාලීනකර නොමැති බවත් දක්වා ඇත. | යොමුගත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) ප්‍රකාරව මිල ගණන් විවෘත කිරීමේ කමිටුව පත්කිරීම ප්‍රසම්පාදන මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත් රු.2,099,900 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2023 මාර්තු 29 දින කැඳවූ මිල ගණන්, ප්‍රසම්පාදන මණ්ඩලය විසින් පත්කළ කමිටුවක් විසින් සිදුකර නොතිබුණි. එසේම මෙම ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදීමට ප්‍රමාදවීම, කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීම හා ගිවිසුමකට එළඹීම ප්‍රමාදවීම හේතුවෙන් අදාළ භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට මිල කැඳවීම් දිනයේ සිට මාස 05 ක කාලයක් ගතවී තිබුණි. | විගණනයෙන් කරුණු පෙන්වා දුන් පසු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (අ) ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටු සඳහා 2023.08.22 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත. තාක්ෂණික ඇගයුම් කමිටු සභාපති හා සාමාජිකයන්හට නොවැලැක්විය හැකි වෙනත් හදිසි රාජකාරිමය කටයුතුවල නිරතවීමට සිදුවීම සහ තවත් කරුණු හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාදීම ප්‍රමාද වූ අතර, සැපයුම්කරුවන් විසින්ම දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාල වෙත උපකරණ සැපයීම මිල කැඳවීමේ දින සිට මාස තුනත්, හතරත් අතර අවසන්කර ඇත. | යොමුගත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | කාර්යසාධන සුරක්ෂණය ලබාගැනීම සහ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාදයකින් තොරව සිදුකිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී තොරතුරු තාක්ෂණ අංශය සඳහා රු.590,000 කට Windows Server මෙහෙයුම් පද්ධතියක් මිලදී ගැනීම සඳහා වූ ලංසු ලියවිලි ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවල අනුමැතිය ලබා ගැනීමකින් තොරව සිදුකර තිබූ අතර, ඒ සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට ද කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙම තත්ත්වය නිවැරදිකර ඇති බව දන්වා ඇත. | යොමුගත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව භාණ්ඩ මිලදී ගැනීමකට පෙර විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.1,487,500 ක් වටිනා පරිගණක යන්ත්‍ර 05 ක් මිලට ගැනීමට අදාළ ගිවිසුමකට එළඹ තිබුණේ යන්ත්‍ර මිලදී ගෙන මාස 01 1/2 ක් ද ගත වූ පසුව වූ අතර, එයට අදාළ ලංසු විවෘත කිරීමේ කමිටුවට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩ මිලදී ගැනීමට පෙර විධිමත් ගිවිසුම අත්සන්කර නොමැති බවත්, ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බවත්, ලංසු විවෘත කිරීමේ කමිටු සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය 2023.08.22 ලබාගෙන ඇති බවත් දක්වා ඇත. | යොමුගත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ප්‍රකාරව වැට් බදු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවනු ලබන වැට් බදු පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. | දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක CGIR/2020/02-2 හා 2020.05.26 දිනැති ලිපිය අනුව සෑම කාර්තුවක් අවසානයේදී සඳහන් ඊ-මේල් ලිපිනය වෙත යොමුකර ඇති අතර, විගණකාධිපති වෙත පිටපතක් එවා නොමැති බවත්, ඉදිරියේදී එහි පිටපතක් යොමු කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ගෙවනු ලබන වැට් බදු පිළිබඳ විස්තර විගණකාධිපතිවරයා වෙත ද යොමු කළ යුතු ය. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2022 ජනවාරි 20 දින අනතුරකට පත්වීම හේතුවෙන් සිදුවී ඇති අලාභය රු.1,735,950 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූණු අතර, අනතුර සිදුවී වසර 02 කට අධික කාලයක් ගතවී තිබුණ ද 2024 මැයි මස වන විටත් පරීක්ෂණ අවසන් නොකර හානි සම්බන්ධයෙන් මු.රෙ.104(1)(අ), මු.රෙ.104(3) හා මු.රෙ.104(4) ප්‍රකාරව සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 2.5 ඡේදය ප්‍රකාරව කටයුතු ඉටු කිරීම පැහැර හැර තිබුණි. | මු.රෙ. 104 (1)(අ) ප්‍රකාරව, කමිටුවක් පත්කර ඇති අතර, එහි වාර්තාව ලද විගස ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා ඇත. | යොමුගත චක්‍රලේඛයට හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ආ) | මෙම හානිය සිදුවී වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී ඇතත්, 2024 අගෝස්තු 31 දින වන විටත් අදාළ වාහනයේ අළුත්වැඩියාවන් කටයුතු නිමකර නොතිබුණි. | මේ වන විට වාහනයේ අලුත්වැඩියා කටයුතු අවසන් අදියරේ පවතින බව දන්වා ඇත. | අළුත්වැඩියාවන් අප්‍රමාදව සිදුකර වත්කම්වලට වන හානිය අවම කරගත යුතු ය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි 02 (අ) ප්‍රකාරව ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම්ගත බැඳීම් සඳහා වන වියදම්, බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ආදියෙන් කපාහැරීමක් සිදු කිරීමට උපදෙස් ලබාදී නොතිබුණ ද එවැනි | දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදනයට සෘජුවම සම්බන්ධ ආයතන වලට 1201 මගින් ගෙවීම් කිරීමට ප්‍රතිපාදන සලසාගැනීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවූ බව දන්වා ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වියදම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව සලසා තිබූ රු.7,015,508 ක ප්‍රතිපාදන, චක්‍රලේඛයට අනුව වියදම් සීමා කිරීමක් වශයෙන් දක්වා කපා හැරීමට කටයුතු කර වර්ෂයට අදාළව ගෙවීමට තිබූ රු.10,474,112 ක් වර්ෂය අවසානයේ බැරකම් වශයෙන් බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | | |
| (ආ) | | මු.රෙ.143(2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් හිඟ ආදායම් අය කරගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවරගත යුතු බව දක්වා තිබුණි. පසුගිය වර්ෂ කිහිපයේදී හිඟ සමථ ශේෂය ක්‍රමිකව වැඩිවී තිබුණ ද, හිඟ සමථ මුදල් අය කරගැනීම සඳහා හෝ 2022 අංක 31 දරන නොතාරිස් සංශෝධන පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි. | දැනට දෙපාර්තමේන්තුවේ පවතින හිඟ සමථ මුදල් අයකර ගැනීමට නොහැකි නම් ඒ සම්බන්ධයෙන් අදාළ නොතාරිස්වරයාට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කරන ලෙස 15/2022 චක්‍රලේඛයෙන් හඳුන්වාදී ඇත. එසේම වාර්ෂික නොතාරිස් බලපත්‍රය අලුත් කිරීමට ප්‍රථම නොතාරිස්වරුන්ගේ හිඟ සමථ මුදල් පිළිබඳ වාර්තාවක් තම බල ප්‍රදේශයට අයත් සෑම මහාධිකරණයක් වෙතම දන්වා යවන ලෙස සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්ට දැනුවත්කර ඇත. එමගින් හිඟ සමථ මුදල් අය කරගැනීම කඩිනම් වී ඇති බවත්, හිඟ සමථ වාර්තා සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් 2024 අප්‍රේල් මාසයේ මහාධිකරණ වෙත ඉදිරිපත්කර ඇති බවත් දක්වා ඇත. | මුදල් රෙගුලාසිවලට සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1589/30** දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **96, 97, 101, 103, 105** හා **106** ප්‍රකාරව අවුරුදු තුනක පරිවාස කාලයකට හෝ වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන පරිදි රෙජිස්ට්‍රාර් සේවයේ **III** පන්තියේ **II** ශ්‍රේණියට **2005** සිට **2016** වසර දක්වා කාලය තුළ බඳවාගෙන තිබුණු නිලධරයින් **30** කගේ සහ **2018** වසරේදී බඳවාගෙන තිබුණු | ස්ථිර කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මේ වන විට තනතුරේ ස්ථිරකර ඇති අතර, සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් හට එම අඩුපාඩු පිළිබඳව දැනුම්දී ඇත. එම අඩුපාඩු සම්පූර්ණ කරන නිලධාරීන් ස්ථිර කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව දක්වා ඇත. | කාර්ය පටිපාටික රීති ප්‍රකාරව කටයුතුකර ඒ පිළිබඳව නිලධරයා දැනුවත් කිරීමට සහ ඒ බව ඔවුන්ගේ ලිපිගොනු තුළ සටහන් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නිලධරයින් **45** කගේ පත්වීම් ස්ථිර කිරීමට හෝ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට හෝ කටයුතුකර නොතිබුණි. | | |
| (ii) | කාර්ය පටිපාටික රීති **132** ප්‍රකාරව රජයේ නිලධාරයෙකුට සිය කාර්යක්ෂමතා කඩඉම ඉක්මවන ලද දිනය අනුව ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය ගැලපිය යුතු වුවත්**, 2023** ඔක්තෝබර් **31** දක්වා සිය කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යාමට අපොහොසත් වූ නිලධාරින් **41** දෙනෙකුගේ ජ්‍යෙෂ්ඨත්වය කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත් නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා සමානව ගැලපීමට කටයුතුකර තිබුණි. | මෙම නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයක ප්‍රතිඵල ලැබීමකින් පසුව ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ පිළිවෙල වෙනස් වන අතර**, 2023** ඔක්තෝබර් මස පැවැත් වූ පරීක්ෂණයේ ප්‍රතිඵල මත මෙම ලේඛනය යාවත්කාලීනකර **2024.07.01** දින සිට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | නියමිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පවත්වා ජ්‍යෙෂ්ඨතාවය නිසි පරිදි ගැලපීමට කටයුතු කළ යුතු ය. |
| (iii) | කාර්ය පටිපාටික රීති **135** හි විධිවිධානවලට පටහැනිව හා ආයතන සංග්‍රහයේ **XII** වැනි පරිච්ඡේදයේ **16:10** වගන්තිය සාවද්‍ය ලෙස නිර්වචනය කරමින් වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබූ මෙන්ම නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම ඉක්මවීමට අසමත් වූ ඇතැම් නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය එවැනි නිවාඩු ලබා නොගත් නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වයටත් ඉහළින් තැබීමට කටයුතුකර තිබුණි. | ආයතන සංග්‍රහයේ **XII** පරිච්ඡේදයේ **16:10** වගන්තිය අනුව වැටුප් රහිත විදේශ නිවාඩු ලබගත් නිලධාරීන්ගේ නිවාඩු කාලසීමාව වැටුප් වර්ධක ගෙවීමේ හා උසස් කිරීමේ කාර්යයන් සඳහා සැලකිය යුතු බැවින් එම නිවාඩු කාලයන් සේවා කාලයෙන් අඩුකර ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස්කර ඇති බව දන්වා ඇත. | නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමේදී කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන යථා පරිදි නිර්වචනය කර ගත යුතු ය |
| (iv) | කාර්ය පටිපාටික රීති 122 හා 123 විධිවිධාන ප්‍රකාරව සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවාගැනීමේ පටිපාටියෙහි හෝ නියමකර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම පැවැත්විය යුතු වුවත්, රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වර්ෂයකට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකක් පැවැත්විය යුතු වුව ද, 2013 ජනවාරි සිට 2023 වර්ෂය | 2013.01.19 දිනැතිව රෙජිස්ට්‍රාර් සේවයේ III/II තනතුරට පත් කළ නිලධාරීන්ට 2015 හා 2016 වර්ෂවල පැවැත් වූ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පවත්වා ඇති අතර, 2022 සහ 2023 වර්ෂවලදී එය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මගින් සිදුකර ඇත. තවත් කඩයිම් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මේ වන විට SLIDA ආයතනය වෙතින් ඇස්තමේන්තු කැඳවා ඇති බව | නියමිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අවසානය දක්වා වූ වර්ෂ 11 ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 05 ක් පමණක් පවත්වා තිබුණි. | දන්වා ඇත. | |
| (v) | කාර්ය පටිපාටික රීති 251 ප්‍රකාරව බලය අභිනියෝජිත බලධරයා විසින් රජයේ ප්‍රතිපත්තිවලට සහ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමත ස්ථාන මාරු පටිපාටියක් විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර, දෙපාර්තමේන්තුගත ඇතැම් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු නිසි ක්‍රමවේදයක් මත සිදුකර නොමැති අවස්ථා ද නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ ස්ථාන මාරු බොහෝ විට වර්ෂය මැද දිනයක ක්‍රියාත්මක වන පරිදි නියෝගය නිකුත් කරන අතර, ඒ සඳහා වන ස්ථාන මාරු වැඩසටහන පෙර වර්ෂයේ අවසානයේදී සකස් කරනු ලබයි. 2025.01.01 දිනෙන් පසු එළඹෙන වර්ෂය සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය මේ වන විට සකස්කර ඇති අතර, එය අවසන් වූ පසු අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට ද කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති ගබඩා තොග සම්බන්ධයෙන් විශේෂ සමීක්ෂණයක් සිදුකිරීමට පත්කළ සිවි පුද්ගල කමිටුව 2023 සැප්තැම්බර් 26 දිනැති වාර්තාව අනුව වටිනාකම රු.507,764 ක් වූ අයිතම 14 ක භාණ්ඩ 3,453 ක ඌනතා සහ අයිතම 31 ක භාණ්ඩ 428 ක අතිරික්තතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට නිර්දේශකර තිබුණ ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. කෙසේ වුව ද, නිසි විමර්ශනයකින් තොරවම ඒ වන විට සේවයේ නියුතුව සිටි ගබඩා භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධව කටයුතු කළ නිලධාරිනිය වෙත තනතුර හැරයාමේ නිවේදනයක් 2023 ජනවාරි 12 දින නිකුත්කර තිබුණි. | මේ සම්බන්ධව මූලික විමර්ශනය සිදු කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන අංශය වෙත යොමුකළ අතර, එම අංශයේ විමර්ශන නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශයෙන් සිදු කරගන්නා ලෙස දක්වමින් නැවත හරවා එවා ඇත. ඒ අනුව ඒ සඳහා දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශයේ විමර්ශන නිලධාරීන් යෝජනාකර අනුමැතියට ඉදිරිපත්කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු අතර, ප්‍රමාදයන්ට හා නිසි වගවීමකින් තොරව කටයුතුකර ඇති නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ගගත යුතු ය. |
| (ඉ) | ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදුකර තිබුණු විනය විරෝධී කටයුතු සම්බන්ධයෙන්, මූලික විමර්ශණ පැවැත් වීමට 2021 නොවැම්බර් 09 දින රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බවත්, කොවිඩ් වසංගත තත්ත්වය හා රටෙහි පැවති අස්ථාවර වාතාවරණය හමුවේ නිලධාරීන් කැඳවීම සීමාවීම හා අනෙකුත් කටයුතු හේතුවෙන් මෙම | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ලබාදී තිබුණ ද මාස 28 ක පමණ කාලයක් ගත කර ඇතත් අදාළ මූලික විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. | කාලය ගතවී ඇති බව සඳහන්කර ඇත. මූලික විමර්ශනය රේඛීය අමාත්‍යාංශය මගින් ආරම්භකර නිලධාරීන්ගෙන් ප්‍රකාශ ලබාගෙන ඇති බවත් දක්වා ඇත. | |
| (ඊ) | කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයේ නියුතු ඇතැම් නිලධාරීන් විසින් සිදු කරන අල්ලස් ලබාගැනීම් සහ මහජනතාවට හිංසා පීඩා සිදු කිරීම සම්බන්ධව ජනාධිපතිතුමා වෙත යොමුකර තිබූ නිර්නාමික ලිපියක් 2020 ජූලි 10 දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකළ මධ්‍යම කළාප සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ඉදිරිපත්කර තිබුණ ද, එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව තුළ ස්ථිරව විමර්ශන ඒකකයක් ආරම්භ කළ අතර, ඉන් ප්‍රථම නිසි ක්‍රමවේදයක් ඔස්සේ විමර්ශන කටයුතු සිදු වී නොමැති අතර, වර්තමානය වන විට එම තත්ත්වය මගහැරී ඇත. මේ වන විට නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු අතර විමර්ශන වාර්තා සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතු ය. |
| (උ) | පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2013 වර්ෂයේ දී සිදුවී තිබුණු රු.532,600 ක මුදල් වංචාවක් සම්බන්ධ චෝදනා පත්‍රයක් සඳහා පිළිතුරු ලබාගැනීම සඳහා මාස 15 ක කාලයක් ගතකර තිබුණු අතර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට විමර්ශන වාර්තාවේ දින සිට මාස 22 ක කාලයක් ගතකර තිබුණි. මේ හේතුවෙන් මු.රෙ.104(2) ප්‍රකාර වාර්තාව මහා භාණ්ඩාගාරය වෙත යැවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තව ද, මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශවලට අනුව, මෙම මූල්‍ය අක්‍රමිකතාවය අනාවරණයකර ගැනීමට අපොහොසත් වූ නිලධාරිනිය වෙත චෝදනා පත්‍රයක් නිකුත්කර තිබුණේ විමර්ශන වාර්තාවේ දින සිට මාස 39 ක් ද ඉක්මවීමෙන් පසු වූ අතර, ලද | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බවත්, පැවති කොවිඩ් වසංගත තත්වය හා රටෙහි පැවති අස්ථාවර වාතාවරණය හමුවේ නිලධාරීන් කැඳවීම සීමාවීම හා අනෙකුත් කටයුතු හේතුවෙන් මෙම කාලය ගතවී ඇති බව සඳහන්කර ඇත. නිලධාරිනියට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කිරීම සඳහා කටයුතු සම්පාදනය කෙරෙමින් පවතින අතර, මූල්‍ය අක්‍රමිකතාවය අනාවරණය කරගැනීමට අපොහොසත් වූ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරිය චෝදනාපත්‍රයට පිළිතුරු ලබාදී ඇති අතර, ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු අතර, අනවශ්‍ය ප්‍රමාදයන් සිදු නොකිරීමට වග බලාගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පිළිතුරු මත ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | | |
| (ඌ) | (i) | ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2020 මැයි 27 දින සිදුකළ මුදල් වංචාවක් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2020 ජුනි 30 දින පත්කළ කමිටුව විසින් මාස 16 ක් ප්‍රමාදකර තිබුණු සිය වාර්තාව, ලේකම්වරයා විසින් 2021 දෙසැම්බර් 06 දින දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණු අතර, එදින සිට මාස 19 ක් ගතවන තුරුත් නිදහසට කරුණු විමසා නොතිබුණි. මේ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයා විසින් ද 2021 අගෝස්තු 30 දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම්දී තිබුණ ද, ඒ සඳහා කමිටුවක් පත් කිරීමට මාස 05 ක් ද, එහි විමර්ශන වාර්තාව ලබාගැනීමට මාස 14 ක් ද ගතකර තිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විමර්ශන අංශය මගින් විමර්ශන කටයුතු සිදුකර ඇති බවත්, ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලද ලිපියට අනුව රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලද නියෝගය පරිදි පරීක්ෂණයක් පැවැත්වීම සඳහා 2021.12.14 දින ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත පවරා ඇත. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මූලික විමර්ශන වාර්තාව ලැබුණු පසු ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සිදු කරන විමර්ශනයට අදාළ කරගැනීමට සහ එම නිරීක්ෂණ ලබාගැනීමට එහි පිටපත් 2022.01.05 දින ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමුකර ඇති අතර, එහි වාර්තාව 2023.03.31 දින ලබාදී ඇති බැවින්, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර ඇති බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු අතර අනවශ්‍ය ප්‍රමාදයන් සිදු නොකිරීමට වග බලා ගත යුතු ය. |
| | (ii) | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩය අනුව, රජයට ලැබිය යුතු මුදල් සාවද්‍ය ලෙස වංචා කිරීම හා රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරීම රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය යටතට අයත් වුව ද, මෙම මූලික විමර්ශනය අනුව එය දෙවන උපලේඛනය යටතට අයත්වන වැරදි වශයෙන් අර්ථ දක්වා අදාළ නිලධාරින්ට ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශකර තිබුණි. ඒ අනුව මෙම සිදුවීමට ඍජුවම සම්බන්ධ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා ප්‍රධාන කාර්යාලය වෙත ස්ථාන මාරු කිරීමට නිර්දේශකර තිබුණ ද, එය ක්‍රියාත්මක නොකර 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවක් | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් මූලික විමර්ශනය සිදුකර මූලික විමර්ශන වාර්තාව අප වෙත යොමුකර ඇති අතර, එහි නිර්දේශ අනුව කටයුතු කර ඇති බව දන්වා සිටින අතර, විගණන නිරීක්ෂණය පිළිගෙන ඇත. 2023 වාර්ෂික ස්ථාන මාරු යටතේ බෙන්තර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුකර ඇත. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කරන ලද මූලික විමර්ශනයේ වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත්තේ 2021.12.27 දින වන අතර, නිලධාරියා සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරෙහි පූර්ණකාලීනව රාජකාරි ආවරණය සඳහා පත්කර ඇත්තේ 2021.08.23 දින බැවින් එදින වන විට එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවකාශ නොතිබූ බව දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීමටත්, මෙම සිදුවීමට ආධාර අනුබල දුන් බවට චෝදනා ලද ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණ ද, ඒ අනුව කටයුතු නොකර, 2021 අගෝස්තු මස සිට සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරක පූර්ණකාලීනව රාජකාරි ඉටුකිරීම සඳහා පත්කිරීමටත් කටයුතුකර තිබුණි. | | |
| (එ) | රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගන්නා ලද ඇතැම් නිලධාරින්ට අදාළ වාර්ෂික සමාලෝචන වාර්තා නියමිත කාලයට පෙර සම්පූර්ණකර ඔවුන්ගේ පත්වීම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඇතැම් නිලධාරින්ගේ යාවත්කාලීන වූ පෞද්ගලික ලිපිගොනු පෙර සේවා ස්ථානයෙන් ගෙන්වා ගැනීමට ද අසමත්වී තිබුණි. තව ද මෙම තනතුර සඳහා බඳවාගත් ඇතැම් නිලධාරින් ඔවුන්ගේ ලිඛිත පරීක්ෂණවලින් සමත්වී ඇති බවට ප්‍රතිඵල ලේඛනවලින් සනාථ කරගත නොහැකි විය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බවත්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීමට සටහන්කර ගන්නා බවත් දක්වා ඇත. | නිලධාරින් සම්බන්ධ ලිපිගොනු නිසි පරිදි හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය. |
| (ඒ) | රෙජිස්ට්‍රාර් සේවය III ශ්‍රේණියේ තනතුරුවලට බඳවාගැනීම සඳහා 2007 නොවැම්බර් 25 දින පවත්වා තිබුණු විභාගයෙන් ලකුණු 232 - 192 ත් අතර, ලකුණු ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින් 83 දෙනෙකු තනතුර සඳහා පත්කරගෙන තිබූ නමුත්, ලකුණු 259 - 193 ත් අතර ලකුණු සංඛ්‍යාවක් ලබා ගෙන තිබූ අපේක්ෂකයින් 117 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහාවත් කැඳවීම්කර ඇති බවට විගණනය වෙත සනාථ නොවී ය. | විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම්කර ඇති අතර, ඒ සඳහා සහභාගී වී ඇත්තේ අඩු ප්‍රමාණයකි. සහභාගී වූ ප්‍රමාණයෙන් තෝරාගත් නිලධාරී සංඛ්‍යාව පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් වී නොමැති බැවින් උක්ත විභාග ප්‍රතිඵල මතම තවත් පිරිසක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇත. මෙසේ තෝරා නොගත් අපේක්ෂකයන් 117 දෙනා සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ හෝ පත්වීම් භාර නොගත් අපේක්ෂකයන් බව දන්වා ඇත. | බඳවාගැනීම් විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතු අතර, අවශ්‍ය තොරතුරු පවත්වා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ඉහත (ඒ) ඡේදයේ සඳහන් විභාගයට අදාළ අනුමත බඳවාගැනීමේ පටිපාටියක් නොවුණු අතර, තනතුරු සඳහා තෝරාගන්නා ලද අපේක්ෂකයින් 83 දෙනා අතරින් විෂයයන් 4 ටම ලකුණු 40 ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයින් ගණන 22 කු පමණක් වූ අතර 61 දෙනෙකුම විෂයයන් දෙකකට හෝ එකකට ලකුණු 39 ට වඩා අඩු ලකුණු ලබාගෙන තිබූ අපේක්ෂකයන් විය. | 2007 වර්ෂයේ පැවැත්වූ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ අනුපිළිවෙල, විෂයයන් 4 හිම ලකුණුවල එකතුව පදනම් කරගෙන සකස්කර තිබූ අතර, විෂයයන් 4 ටම ලකුණු 40 ට වඩා ලබා තිබූ අපේක්ෂකයන් ප්‍රමාණවත් නොවූ බැවින් විෂයයන් 4 හිම මුළු ලකුණු පදනම් කරගෙන ඇති බව දන්වා ඇත. | බඳවාගැනීම් විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතු ය. |
| ඕ) | දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා නිසි අනුමැතියන් මත ලබාදෙනු ලබන අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අංශ අතර, නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු නොකිරීම හේතුවෙන් ඇතැම් නිලධාරින්ට ගෙවා ඇති මාසික වැටුප නිවැරදිව ගණනය කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. | දැනට එම තත්ත්වය මග හරවා ගැනීමට අංශ අතර සම්බන්ධීකරණය සිදුකෙරෙමින් පවතින බව දන්වා ඇත. | දෙපාර්තමේන්තුවේ අංශ අතර, නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කළ යුතු ය. |
| (ක) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 7.1 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 238/(5) ප්‍රකාරව, මාසික වැටුප් ලබන එක් එක් නිලධාරියා විසින් පඩි සටහන් පත්‍රයේ අත්සන් තබා ඇති බවට වැටුප් ගෙවන නිලධාරියා විසින් තහවුරු කර ගත යුතු අතර, එසේ කටයුතු නොකළ ඇතැම් නිලධාරින්හට ඊළඟ මස වැටුප ද ගෙවීමට කටයුතු කර තිබුණි. | මේ පිළිබඳව ලිඛිතව හා වට්ස්ඇප් සමූහය හරහා දැනටමත් දැනුවත්වීම්කර ඇති අතර, එසේ නොකරන නිලධාරීන්ට මැයි මස වැටුප් ගෙවීම නතර කරන බව අමාත්‍යාංශයේ පැවති මාණ්ඩලික නිලධාරි රැස්වීමේදී ප්‍රධාන ගණකාධිකාරී විසින් දැනුම්දී ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ග) | 2023 වර්ෂය තුළ විදේශීය පුහුණු පාඨමාලා හා ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් තිදෙනෙකු ඔවුන් සහභාගීවූ පාඨමාලාවන් පිළිබඳ වාර්තාවක් හෝ ඉදිරිපත් කිරීමක් (Presentation) සිදුකර ඇති බවට සනාථ නොවී ය. එසේම විදේශ පුහුණු ලබාදීම පිළිබඳව තොරතුරු | AQ 13 වාර්තාවට අනුව 2023 වර්ෂය තුළ විදේශ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වූ නිලධාරීන් 5 දෙනෙකුගෙන් නිලධාරීන් 4 දෙනෙකුම 2023 දෙසැම්බර් 31 වන විට සහභාගී වූ පුහුණු වැඩසටහන් සඳහා වාර්තා ලබාදී ඇත. අනෙක් නිලධාරිනියට අදාළ වාර්තාව ලබාදෙන ලෙස දැනුවත්කර ඇත. දෙපාර්තමේන්තුවේ සංවර්ධන | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු අතර විගණනයට ඒ බව සනාථ කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | හා පුහුණු අංශය 2021 වර්ෂයේ ස්ථාපිත කළ බැවින්, එයට අදාළව විදේශ පුහුණුවීම් අවස්ථා ලබාගෙන ඇති ගණන හා පුහුණු අවස්ථා ලබාගෙන නොමැති නිලධාරීන් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව ද දන්වා ඇත. | |
| (ජ) | දෙපාර්තමේන්තුවේ කාර්යාල 03 ක් සඳහා පසුගිය කාලයන්ට අදාළ මාසික විදුලි බිල්පත් ගෙවීම නියමිත කාලයට වඩා ප්‍රමාදවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකර තිබූ පොළී හා අධිභාර මුදල රු.210,633 ක් වූ අතර, හිඟ මුදල් නොගෙවීම හේතුවෙන් විසන්ධි කළ විදුලි සැපයුම නැවත ලබාදීම සඳහා අයකළ අමතර ගාස්තුව රු.6,000 ක් විය. | මාසික බිල්පත් නිරවුල් කිරීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ලේඛන කඩිනමින් ගෙන්වා ගැනීම සඳහා වට්ස්ඇප් සමූහයක් නිර්මාණයකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. කොරෝනා වසංගත තත්ත්වය සහ රටේ පැවති අතර, අස්ථාවර ආර්ථිකය හේතුවෙන් බිල්පත් ලැබීම ප්‍රමාද වීම, නිලධාරීන් සේවයට කැඳවීම සීමාවීම යනාදී කරුණු මේ සඳහා බලපා ඇති බව සඳහන්කර ඇත. | ජල බිල්පත් හා විදුලි බිල්පත් නියමිත දිනට ගෙවීමට වගබලා ගත යුතු ය. |
| (ත) | මාලිගාවත්ත මධ්‍යම ලේඛනාගාරයේ විදුලි බිල්පත් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් විදුලි බල මණ්ඩලයට ගෙවීමට සිදුවූ අධිභාරය සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර එය අයකර ගත යුතු නිලධාරින් වෙත් නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 2023 ඔක්තෝබර් 10 දින නියෝග ලබාදී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් මු.රෙ.101 ප්‍රකාරව කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මාළිගාවත්ත මධ්‍යම ලේඛනාගාරයේ විදුලි බිල්පත් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් අධිභාර මුදල් ගෙවීමට සිදු වීම සම්බන්ධව මූලික පරීක්ෂණයක් සිදුකර පරීක්ෂණ වාර්තාවක් ලබා දෙන ලෙස දන්වමින් ලිපිගොනු අංක RG/AB/POU/06/01/04 හා 2024.02.05 දිනැතිව විමර්ශන අංශයට යොමුකර ඇත. දැනට විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශන කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු ය. |
| (ද) | 2022 දෙසැම්බර් 20 දිනැති අංක HA/05/20/05 දරන අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව නියමිත කාලය තුළ, ගෙවීම් නොකර හිඟ බිල්පත් ඇතිවීමට හේතු සොයා බලා අවශ්‍ය පියවර ගැනීමටත්, 2023 වර්ෂයේ සිට මෙවැනි මූල්‍ය අලාභ සිදුවීම වැළැක්වීමට අදාළ පියවර ගත යුතු බවටත් උපදෙස් ලබාදී | විදුලිය විසන්ධි වීමෙන් මහජන සේවා සැපයීම අඩාල වීම වැළැක්වීම සඳහා අදාළ හිඟ මුදල් සමඟ බිල්පත ගෙවීමට පියවරගෙන ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක HA/05/20/05 හා 2022.12.20 දිනැති ලිපියේ දෙවෙනි ඡේදයේ සඳහන් පරිදි කටයුතු කිරීම අතපසු වී ඇති අතර, හිඟ බිල්පත් ගෙවීමට ඇති කාර්යාලවලට අදාළ | රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් අනුව කටයුතු කිරීම අතපසු නොකළ යුතු අතර, සිදුවී ඇති එවැනි වැරදි ඉදිරියට සිදු නොවීමට වග බලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණ ද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයට අදාළව ද හිඟ බිල්පත් ඇතිවීම නිසා කාර්යාල 08 කට අදාළව දඩ පොළී ගෙවීමට සිදු වී තිබීමෙන් තවදුරටත් රජයට අලාභ සිදුවී ඇතිබව නිරීක්ෂණය විය. | විස්තරාත්මක බිල්පත් ගෙන්වාගෙන ඒ පිළිබඳව විශ්ලේෂණයකර ගෙවීම් කටයුතු කරන බැවින්, ඉදිරියේදී මෙම තත්ත්වය අවම කරගත හැකි බව දක්වා ඇත. | |
| (න) | බදු පදනම මත මිලදී ගෙන තිබුණු කාර්යාල පරිශ්‍ර 06 කට අදාළ බදු ගිවිසුම් කාලය අවසන් වී මාස 03 - 12 ත් අතර, කාලයක් ගතවී තිබුණ ද, නව බදු ගිවිසුම්වලට එළඹීමකින් තොරව රු.943,500 ක මාසික බදු මුදල් ගෙවමින් තවදුරටත් කාර්යාල පවත්වාගෙන ගොස් තිබුණි. | අදාළ කාර්යාලවල බදු ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික බදුකුළිය සඳහා වටිනාකම ලබාගත යුතු ය. මාසික තක්සේරුව ලබා ගැනීම සඳහා යම්කිසි කාලයක් ගත වී ඇති අතර, එය පාලනය කිරීමට සෘජු හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වන අතර, මෙම වාර්තා ලැබෙන තුරු කාර්යාලය පවත්වාගෙන යා යුතු බැවින්, පෙර ගෙවූ මාසික මුදලටම බදු ගෙවීම කළ බව දන්වා ඇත. | කුලී ගොඩනැගිලිවල බදු කාලය අවසන්වීම නිශ්චිතව හඳුනා ගත හැකි බැවින් නව ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය සියලු කටයුතු පෙර සූදානමකින් සිදු කළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නොතාරිස් ආඥාපනතේ 31 වන වගන්තියේ සඳහන් රීති නිසි පරිදි අනුගමනය නොකිරීම හා පවතින අඩුපාඩු නිවැරදි කිරීමට ප්‍රමාදවීමත්, ඒවා පිළිබඳව නිලධාරින්ගේ පසුවිපරම් කිරීම නිසි පරිදි සිදු නොවීමත් වැනි කරුණු හේතුවෙන් ලේඛන ලියාපදිංචිය ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, ලේඛනවල පවතින අඩුපාඩු ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමට කටයුතු නොකරන නොතාරිස්වරුන් සම්බන්ධයෙන් විධිමත් පියවරයන් ගැනීමට ද කටයුතුකර නොතිබුණි. | උක්ත විගණනයට අදාළව කඩුවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඉදිරිපත් කළ ලේඛන 80 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලියාපදිංචිකර නොමැති බව දන්වා ඇත. මේ වනවිටත් එම ලේඛන අදාළ නොතාරිස්වරුන් ලවා නිවැරදිකර, ලියාපදිංචිකර මහජනයා වෙත නිකුත්කර ඇති බව කඩුවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් දන්වා ඇත. එසේම නිවැරදි නොකරන ලද අඩුපාඩු සහිත ඔප්පු යම් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කළ බව ද වැඩිදුරටත් දන්වා ඇත. | ආඥාපනතේ රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,818 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 3,916 ක් විය. එහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගෙන බඳවාගත් සංවර්ධන නිලධාරීන් 1,283 ක අතිරික්තයක් සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද ඇතුළත්ව තනතුරු කාණ්ඩ 18 ක අනුමත නිලධාරීන් 185 ක ඌණතාවයක් නිරීක්ෂණය විය. | සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව වැඩිකර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් RG/AB/02/05/25(මු.රෙ.II) හා 2021.09.24 දිනැති ලිපිය මගින් අනුමැතිය ඉල්ලා ඇති බව සඳහන්කර ඇත. ඌන කාර්ය මණ්ඩලය ලෙස දැක්වෙන්නේ අනෙකුත් සේවාවල අනුමත සේවක සංඛ්‍යාව අතරින් පුරප්පාඩු සංඛ්‍යාව බව දන්වා ඇත. | අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගැනීම් සිදුකිරීමට වගබලා ගත යුතු ය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ පොත් බැඳුම්කරු තනතුරු 77 න් තනතුරු 03 ක් පමණක් පුරප්පාඩුව පැවතිය ද ගාල්ල දිස්ත්‍රික්කයට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරින් 06 ක් අනුයුක්ත කිරීම හේතුවෙන් අනෙකුත් දිස්ත්‍රික්ක තුළ තනතුරු පුරප්පාඩු නිර්මාණය වී තිබුණි. | විගණනය නිරීක්ෂණය සඳහා එකඟ වන අතර, ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන්කර ගත් බව දන්වා ඇත. | කාර්ය මණ්ඩලය නිසි පරිදි කළමනාකරණය කර කාර්යක්ෂමව සේවයේ යෙදවිය යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව, රෙජිස්ට්‍රාර් සේවයේ නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු සංඛ්‍යාව 31 ක් වූ අතර, එදිනට අනුයුක්ත තනතුරු සංඛ්‍යාව 25 ක් විය. ඒ අනුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 06 ක් පමණක් වුව ද, නිලධාරින් 10 දෙනෙකු සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරුවල රාජකාරි ආවරණය කිරීමේ පදනම මත අනුයුක්ත කරවා තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය. | සේවයේ නියුතු නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් නිලධාරීන් 25 අතුරින් නිලධාරීන් තිදෙනෙකු දෙපාර්තමේන්තුවේ තනතුරුවල පූර්ණකාලීකව රාජකාරී ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය අනුව පත්කර ඇත. ඒ අනුව පුරප්පාඩු ගණන 09 ක් වන අතර, ඉඩම් රෙජිස්ට්‍රාර් නිලධාරීන් 10 ක් නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරුවල රාජකාරී ආවරණය/ රාජකාරී ඉටු කිරීම/ වැඩ බැලීම සිදු කරන බව දන්වා ඇත. | කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ වැඩි කාර්යභාරයක් පවතින අංශයන් හා කාර්යාල 05 ක් සඳහා ස්ථිර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් අනුක්ත නොකර එම තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර්වරු 10 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර එයින් ද ඇතැම් නිලධාරින්ගේ රාජකාරි ආවරණය කිරීමේ කාලය අවසන්ව තිබූ අතර, අනෙකුත් නිලධාරින්ගේ අනුමත කාලය 2024 ජුනි 30 දින වන විට අවසන් වීමට නියමිතව තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 07 සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන කෙටුම්පත් අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති බව දන්වා ඇත. | වැඩි කාර්යභාරයක් පවතින අංශයන් හා කාර්යාල සඳහා පළපුරුදු සහ ස්ථිර නිලධාරින් අනුයුක්ත කළ යුතු ය. |
| (ඉ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 හා 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති කාර්ය පටිපාටික රීති 118 හා 130 ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොගෙන ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරි ආවරණය කිරීමේ පදනම මත නිලධාරීන් 36 දෙනෙක් අනුයුක්තකර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ II පංතියේ) තනතුරුවල රාජකාරී ආවරණය කිරීම සඳහා අතිරේක ඉඩම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ III පංතියේ II/I ශ්‍රේණියේ) නිලධාරීන් පත්කර ඇත. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තිය අනුව හා VII පරිච්ඡේදයේ 12.2.5 වගන්තිය අනුව රාජකාරී ආවරණය කිරීමට යොදා ඇති නිලධරියෙකුට කිසිදු අතිරේක පාරිශ්‍රමිකයක් ලබා නොදෙන බැවින්, එම නිලධාරීන් සඳහා රාජකාරී ඉටු කිරීමේ වැටුපක් හෝ වැඩ බැලීමේ දීමනාවක් ගෙවනු නොලබන බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ විධිවිධාන මධ්‍යම රජයේ නිලධාරින්ට අදාළ නොවන බැවින් කාර්ය පටිපාටික රීති අනුව කටයුතු කළ යුතු ය. |